## ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය - 2014

-----------------------------------------------------------

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1983 අංක 54 දරන ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩල පනතේ 12 වන වගන්තියේ 3 උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI -1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගයශාලා මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලද වටිනාකම රු.12,205,000 ක් වූ උපකරණ වර්ග 08 කට අදාල ඒකක 24 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) මුළුමනින්ම ක්ෂය වූ එහෙත් තවමත් ප්‍රයෝජනයට ගනිමින් පවතින වත්කම් හඳුනාගෙන එහි සාධාරණ අගය පෙන්නුම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ණය පදනම මත ලබාගෙන තිබුණු රු.7,211,022 ක් වටිනා වෛද්‍ය උපකරණ එම වර්ෂයට අදාලව ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.430,000 ක් වටිනා වෛද්‍ය උපකරණයක් ප්‍රාග්ධනිත කිරීම වෙනුවට අයභාර වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් පාරිතෝෂික ප්‍රතිපාදනය නිවැරදිව ගණනය කර නොතිබූ අතර වර්ෂයේ පාරිතෝෂික වියදම රු.2,939,786 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) ගණනය කිරීමේ දෝෂ හේතු කොටගෙන ඉකුත් වර්ෂවලට අදාල පාරිතෝෂික ගෙවීම් රු. 1,216,291 ක් අතීතානුයෝගී ලෙස ගිණුම්වල ගැලපීම් නොකර සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(උ) කාන්දුකරණ අරමුදලෙන් රෝහල වෙත ලැබුණු රු. 1,121,600 ක මුදලක්, රෝහල් ආදායම් පාලන ගිණුමට බැර නොකර, ඉකුත් වර්ෂ ලාභලාභ ශේෂයට බැර කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ඉකුත් වර්ෂයේ අලාභ ශේෂය අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රෝහල් ගාස්තු රු.14,130,657 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) රෝහලට එරෙහිව පනවා තිබුණු නඩුවක් වෙනුවෙන් වන්දි ගෙවීම පිණිස කම්කරු විනිශ්චය සභාවේ තැන්පත් කරන ලද මුදලින් රු. 2,458,814 ක් අදාල පාර්ශවය වෙත ගෙවා තිබුණු අතර එම මුදල සමාලෝචිත වර්ෂයේ සේවක වන්දි ලෙස දක්වනවා වෙනුවට තව දුරටත් තැන්පතු වශයෙන් දැක්වීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු. 2,458,814 කින් වැඩියෙන් දැක්වුණු අතර වර්ෂය අවසානයට වූ තැන්පතු ශේෂයද සමාන අගයෙන් වැඩියෙන් දැක්වුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තථ්‍ය යල්පැනගිය තොග වටිනාකම රු.5,236,987 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනයන්හී එය රු.1,118,887 ක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂය අවසාන තොග ශේෂය හා වර්ෂයේ අතිරික්තයද රු.4,118,100 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) රෝහල් ගාස්තු එක් එක් ආදායම් ශීර්ෂ යටතේ හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම හා සියලුම බිල්පත් ගිණුම්ගත වූයේද යන්න පරීක්ෂා කිරීමක් සිදු නොවීම නිසා මුදලින් ලද ආදායම හා ආදායම් වර්ගීකරණය අතර රු. 14,745,152 ක වෙනසක් ඇති වී තිබුණි. මෙම වෙනස විමර්ශනයකින් තොරව ආදායම් ශීර්ෂ 8 ක් අතර සමානුපාතිකව බෙදා හැර තිබුණි.

**2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්වෙන රු. 91,582,131 ක් වූ වෙළඳ ණයහිමි වටිනාකමින් වර්ෂ 10 කට වඩා පැරණි එකතුව රු. 10,446,000 ක් වූ ණයහිමියන් සනාථ කර ගැනීම සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

**2.2.3 නොසැසඳු පාලන ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව රෝහලේ අංශ තුනක ආදායම රු. 22,473,345 ක් වුවද, එම අංශයන් විසින් නඩත්තු කෙරෙන උපලේඛන සහ මාසික වාර්තා අනුව එම ආදායම රු. 24,535,204 ක් වූයෙන් රු. 2,061,859 ක වෙනසක් විය.

(ආ) වෙළඳ ණයහිමියන් හත් දෙනෙකුට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු. 11,158,712 ක් වුවද, ශේෂ සනාථ සහතික අනුව එම ශේෂය රු. 27,854,420 ක් වූයෙන් රු. 16,695,708 ක වෙනසක් විය.

**2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනයේ දක්වන ණයගැති වටිනාකමින් එකතුව රු. 6,668,561 ක් වසර 5 කට අධික වන අතර, එකතුව රු. 114,503,429 ක් වර්ෂයකට අධික වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ණයහිමියන් හා උපචිත වියදම් තුළ වූ වර්ෂ 2 සිට වර්ෂ 5 අතර කාලපරාසයකට අයත් එකතුව රු. 52,383,802 ක් හා වර්ෂ පහකට වඩා වැඩි කාලයකට අදාල එකතුව රු. 172,360,727 ක ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | රෝහල විසින් චක්‍රලේඛයට අනුගත වූ පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2011 පෙබරවාරි 21 දිනැති අංක 449 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රජයට අවශ්‍ය හදිසි සේවාවන් සපයා ගනු පිණිස බාහිර පුද්ගලයෙකුගේ සේවය දින 45 ක් නොඉක්මවන්නා වූ කෙටිකාලීන පදනමක් මත රු. 30,000 ක උපරිමයකට යටත්ව ලබාගත හැකි අතර, එයට පටහැනි වන අවස්ථාවකදී ඒ සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද, රෝහලේ මූල්‍ය පාලක තනතුර සඳහා අවස්ථා දෙකකදී නිලධාරීන් දෙදෙනෙක් මාස 06 ක හා මාස 03 ක කාලයක් සඳහා මාසිකව රු. 120,000 ක දීමනාවකට බඳවාගෙන තිබුණද, ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතීන් ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| | (i) 7:4:5 වගන්තිය | ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් රෝහල ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම සිදු කර නොතිබුණි. |
| | (ii) 8:3:8 වගන්තිය | අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතියකින් තොරව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ රෝහලෙහි පවත්නා හෙද විද්‍යාලය වෙත රු. 200,000 ක් පරිත්‍යාග කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රෝහල් මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 720,613,254 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 92,286,361 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය රු. 628,326,893 කින් වර්ධනය වී තිබුණි. එම වර්ධනය කෙරෙහි රෝහල් ආදායම රු. 195,925,920 කින් වැඩිවීමද, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන රු. 700,400,000 කින් වැඩිවීමද ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 මණ්ඩලයට එරෙහිව හා මණ්ඩලය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

මණ්ඩලයේ අභ්‍යන්තර සහ බාහිර පුද්ගලයින් 07 දෙනෙක් විසින් විශ්‍රාම ගැන්වීම් වයසට එළඹීමට පෙර විශ්‍රාම ගැන්වීම, උසස්වීම් නොලැබීම, පත්වීමේදී ඉහළ ශ්‍රේණියක් ලබාගැනීම සහ රෝගී සත්කාර සේවාවන්හි පැවති දුර්වලතා යනාදිය පිළිබඳව රෝහලට එරෙහිව අධිකරණවල නඩු 07 ක් ගොනු කර තිබූ අතර පුද්ගලයකු නොගෙවූ රු. 179,000 ක රෝහල් ගාස්තු අයකර ගැනීම සඳහා මණ්ඩලය විසින් එම පුද්ගලයාට එරෙහිව අධිකරණයේ නඩුවක් ගොනු කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

(අ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ රෝහලේ කාර්යසාධනය අඩුවීමක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | කාර්යසාධන මිණුම් දඬු | 2014 වර්ෂයේ සංඛ්‍යාව | 2013 වර්ෂයේ සංඛ්‍යාව | අඩුවීම | ප්‍රතිශතය සියයට |
|---|---|---|---|---|---|
| (i) | හදිසි ප්‍රතිකාර අංශයට ඇතුළත් කළ රෝගීන් සංඛ්‍යාව | 35,060 | 38,323 | 3,263 | 9 |
| (ii) | Peritonial Dialysis සංඛ්‍යාව | 07 | 25 | 18 | 72 |
| | <u>එන්ඩොස්කොපි අංශයේ පරීක්ෂණ සංඛ්‍යාව</u> | | | | |
| (iii) | Bronchoscopy | 17 | 26 | 09 | 34.6 |
| (iv) | ERCPS | 04 | 08 | 04 | 50 |
| (v) | අනෙකුත් | 04 | 36 | 32 | 88.89 |
| (vi) | CCT පරීක්ෂණ (අක්ෂි ඒකකය) | 39 | 76 | 37 | 48.68 |
| (vii) | Medical Chek-up - FEB | 2,719 | 3,733 | 1,014 | 27.16 |
| (viii) | Medical Chek-up - Exeutive | 372 | 637 | 265 | 41.6 |
| | <u>විකිරණ සේවා</u> | | | | |
| (ix) | IVP පරීක්ෂණ | 01 | 05 | 04 | 80 |
| (x) | CT Guided Biopsy පරීක්ෂණ | 16 | 50 | 34 | 68 |

2014 ජනවාරි සහ අප්‍රේල් මාසයේ ශල්‍යාගාරයේ සිදු කරන ලද ශල්‍යකර්ම පිළිබඳ තොරතුරු වෛද්‍ය වාර්තා අංශයට ලබාදී නොතිබීම හේතුවෙන් ශල්‍යකර්ම පිළිබඳ කාර්යසාධනය ඇගැයීමට ලක් කිරීමට නොහැකි විය.

(ආ) රෝහලේ ක්‍රියාත්මක වන වාට්ටු 22 කින් වාට්ටු 8 කම ඇඳන් උපයෝජනය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) 2014 වර්ෂය තුළදී සාමාන්‍ය වාට්ටුවල සිදු කරනු ලැබූ අක්ෂි ශල්‍ය කර්ම සංඛ්‍යාව 1,162 ක් වූ අතර, ගෙවන වාට්ටුවල සිදු කරනු ලැබූ අක්ෂි ශල්‍ය කර්ම සංඛ්‍යාව 1,796 ක් විය. විචලනය 634 ක් වූ අතර එය සාමාන්‍ය වාට්ටුවල සිදු කරනු ලැබූ ශල්‍ය කර්ම සංඛ්‍යාවට සාපේක්ෂව 54.5 ක වැඩිවීමකි. මේ අනුව අක්ෂි ශල්‍ය කර්ම සිදු කිරීමේදී ගෙවන වාට්ටු වෙත රෝගීන් යොමු කිරීමේ වැඩි ප්‍රවනතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂය සඳහා වූ රෝහලේ පවිත්‍රතා කටයුතු සිදු කිරීමේ කොන්ත්‍රාත්තුව රු.2,568,115 ක් වූ මාසික ගාස්තුවක් මත පෞද්ගලික ආයතනයකට පිරිනමා තිබුණි. 2012 වර්ෂයේදී මෙම ආයතනය සේවය සැපයීමට සුදුසුකම් නොලත් ආයතනයක් බවට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් වාර්තා කර තිබුණු අතර, බොහොමයක් අංශවල පවිත්‍රතාවය අසතුටුදායක බව දිගින් දිගටම මහජන සෞඛ්‍ය පරීක්ෂක හා වාට්ටු භාර නිලධාරීන් පෙන්වා දී තිබියදීත්, ඊට සුදුසු පියවරක් ගැනීම වෙනුවට 2012, 2013 සහ 2014 යන වර්ෂ තුනෙහිදීම එම ආයතනය වෙතම කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(ආ) වසරක කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් මූල්‍ය පාලක වෙත 2014 අප්‍රේල් මාසයේ දීමනාව වූ රු. 120,000 ක මුදල අප්‍රේල් 09 දින ගෙවා තිබුණු අතර අප්‍රේල් 10 දින සිට නිලධාරියා සේවය සඳහා වාර්තා කර නොතිබුණි. නිලධාරියාගේ පත්වීම් ලිපිය ප්‍රකාර ලිත් මසක පූර්ව දැනුම්දීමකින් තොරව සේවය අවසන් කිරීම මත නිලධාරියාගෙන් අයවිය යුතු මාසයක වැටුප රු. 120,000 ක මුදල හා අප්‍රේල් මාසය වෙනුවෙන් වැඩිපුර ගෙවන ලද රු. 84,840 ඇතුළුව එකතුව රු. 204,840 ක මුදලක් රෝහල වෙත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රෝහල වෙත නව මූල්‍ය පාලකවරයකු මාස 03 ක කාලයක් සඳහා කාර්ය පැවරුම් පදනම මත මසකට රු. 120,000 ක දීමනාවකට පත් කර තිබුණි. අදාල කාර්ය පැවරුම ප්‍රකාරව නිලධාරියා හට පූර්ණකාලීන අධීක්ෂණය හා සුපරීක්ෂණ කටයුතු ඉටුකළ යුතුව තිබුණද නිලධාරියා පූර්ණකාලීනව සේවයේ නිරත නොවන බව නිරීක්ෂණය විය. තවද අවස්ථා දෙකකදී මෙම නිලධාරියාගේ කාර්යසාධනය ඇගැයීමකට ලක් කිරීමෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාර්ය පැවරුම දීර්ඝ කර තිබුණි.

(ඈ) රෝහල් ආරක්ෂක සේවා සැපයීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේදී සැපයුම්කාර ආයතනය විසින් සේවක සංඛ්‍යාව සහ වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ තොරතුරු එකිනෙකට නොගැලපීම, සේවක අර්ථ සාධක සහ සේවක භාරකාර අරමුදල් ගෙවීම් සම්බන්ධයෙන් සාවද්‍ය තොරතුරු දක්වා තිබීම සිදු කර තිබියදීත් අදාල ආයතනය වෙතටම කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. අනතුරුව සේවා සැපයීමේදී අදාල නිලධාරීන් සංඛ්‍යාව නොසිටීමේ හේතුව මත අදාල සැපයුම්කාර ආයතනයේ සේවා සැපයීම දින 15 කට පමණක් සීමා කර අවසන් කර තිබුණු අතර කලින් සේවා සපයන ලද ආයතනයටම නැවතත් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

(ඉ) 2013 මැයි 09 දින යෞවන කටයුතු අමාත්‍යාංශය හා රෝහල අතර පැවති අවබෝධතා ගිවිසුමට අනුව වසර 03 ක කාලයක් සඳහා සෞඛ්‍ය අධ්‍යයන විශ්වවිද්‍යාල විද්‍යායතනය පිහිටුවා තිබුණි. එසේ වුවද වසර 03 ක කාලයෙන් පසුව අඛණ්ඩව මෙම විද්‍යායතනය පවත්වා ගෙන යාමට හැකිවන අයුරින් නීත්‍යානුකූලව වෙනම ආයතනයක් ලෙස ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

(ඊ) 2014 ජනවාරි 23 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් තීරණය ප්‍රකාරව රෝහල හා විශ්වවිද්‍යාල විද්‍යායතනය අතර කල්බදු ගිවිසුමක් අත්සන් කර විද්‍යායතනයේ පාඨමාලා හදාරන සිසුන්ගේ පාඨමාලා ගාස්තුවෙන් සියයට 25 ක ප්‍රමාණයක් රෝහලට ලබාගැනීමට තීරණය කර තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(උ) 2012 වර්ෂයේදී රු. 335,066 ක් වැය කර ජෙනරේටර් යන්ත්‍රයක සම්ප් පොම්පයේ තෙල් කාන්දුවීම පෞද්ගලික සමාගමකින් අළුත්වැඩියා කර තිබුණද, ඒ සඳහා වසර 03 ක වගකීම් කාලයක් ලබා දී තිබුණු අතර එම වගකීම් කාලය තුලදී නැවතත් එම දෝෂයම පැවත තිබුණු අතර එම සමාගම මගින්ම අදාල අළුත්වැඩියාව සිදු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) රෝහල් සේවකයින්ගේ මරණාධාර මුදල් රෝහල් මුදලින් ගෙවා, මාසය අවසානයේදී එසේ ගෙවන ලද මුදල, මරණාධාර අරමුදල සඳහා ලියාපදිංචි සේවකයින් අතර සමානව බෙදා වැටුපෙන් අයකරගත යුතුවේ. එසේ වුවද පසුගිය හය මාසයක කාලය තුල ගෙවනු ලැබූ සම්පූර්ණ මුදලම මාසය අවසානයේදී සේවකයින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(එ) ශල්‍ය වෛද්‍යවරුන් විසින් ගෙවන වාට්ටුවල සිදු කෙරෙන ශල්‍යකර්ම වෙනුවෙන් රෝගීන්ගෙන් ගාස්තු අයකර එම මුදලින් වෛද්‍යවරුන් වෙත වෘත්තීය ගාස්තු ගෙවීම සිදු කෙරෙන නමුත් එම ලැබීම් නිශ්චිතව හඳුනා නොගෙන වෛද්‍යවරුන් වෙත ගෙවීම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුල ආදායම ඉක්මවා රු. 61,540,958 ක් ගෙවීම් කර තිබූ නමුත් එයට හේතූන් අනාවරණය කරගෙන නොතිබුණි. මෙම ගෙවීම් තුලින් මෙයට ප්‍රථමද වංචාවන්

සිදුව තිබූ බැවින් ශක්තිමත් පාලන ක්‍රම හඳුන්වාදීමේ අවශ්‍යතාවය තවදුරටත් පවතින බව නිරීක්ෂණය විය.

### 4.3 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රාග්ධන වියදම් සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් රු. මිලියන 300 ක ප්‍රතිපාදන සඳහා අනුමැතිය ලබාදී තිබුණද, එසේ අනුමැතිය ලබාදී තිබූ රු. මිලියන 50 ක ඇස්තමේන්තු වටිනාකමක් සහිත විදුලි උත්පාදක යන්ත්‍ර 02 ක් මිලදී ගැනීම සහ රු. මිලියන 50 ක වටිනාකමක් සහිත මධ්‍යම වායු සමීකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම යනාදී කාර්යයන් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන ප්‍රතිපාදනය ලෙස රු.1,700,000,000 ක මුදලක් භාණ්ඩාගාරය වෙතින් ලබාදී තිබුණු අතර දෙසැම්බර් 31 දිනට ඉන් සියයට 32.45 ක ප්‍රතිශතයක් එනම් රු. 551,686,944 ක් උපයෝජනය නොකර බැංකු ජංගම ගිණුමෙහි නිෂ්කාර්යව පැවතුණි. මෙලෙස අතිරික්ත මුදල් පැවතියදී 2015 වර්ෂයේ මුල් මාස 04 සඳහා රු. 374,086,000 ක මුදලක් පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාරය වෙතින් ලබාගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූලධන වත්කම් මිලදී ගැනීම සඳහා රු. 190,225,273 ක මුදලක් ලබාදී තිබුණද, ලෙජර් ගිණුම් පරීක්ෂාවේදී රු. 141,899,117 ක් වටිනා ස්ථාවර වත්කම් මිලදී ගෙන තිබුණෙන්, රු. 48,326,156 ක මුදලක් උපයෝජනය කර නොතිබුණි. එසේ අරමුදල් පැවතියදීත් රෝහල විසින් පුනරාවර්තන ප්‍රදානය උපයෝගී කරගනිමින්ද රු. 29,009,588 ක් වටිනා ස්ථාවර වත්කම් මිලදී ගෙන තිබුණි.

### 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රෝහලෙහි ප්‍රධාන ගබඩා 07 ක රු. 10,790,145 ක් වූ තොග නිෂ්කාර්යව පැවති අතර, ඉන් රු. 7,028,371 ක තොග 2012 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි.

### 4.5 හඳුනාගන්නා ලද පාඩු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන ගබඩා හා උප ගබඩාවල කල් ඉකුත් වූ තොග වටිනාකම රු. 5,403,347 ක් විය. 2012 පෙබරවාරි මාසයේ ස්නායු ශල්‍ය ඒකකය සඳහා මිලදීගත් රු.5,180,000 ක් වූ තොගයෙන් රු. 4,118,000 ක් වූ තොගයක් කල් ඉකුත් වී තිබුණි. වාර්ෂික පරිභෝජනය හා නිවැරදි ඇස්තමේන්තු සකස් කිරීමකින් තොරව විශාල ප්‍රමාණයන්ගෙන් මිලදී ගැනීම තුලින් මෙකී පාඩුව සිදු වී තිබුණි.

### 4.6 ප්‍රමාද වූ ව්‍යාපෘති

රෝහල සඳහා මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2010 ජූලි 19 දින රු. 24,953,859 ක වටිනාකමට පෞද්ගලික ආයතනයක් වෙත පවරා තිබුණි. අදාල කොන්ත්‍රාත්තුවේ වැඩ උප කොන්ත්‍රාත් ආයතනයක් මගින් 2010 නොවැම්බර් 25 දින ආරම්භ කර තිබුණු අතර එදින සිට සති 26 කින් අවසන් කළ යුතුව තිබුණද, 2014 නොවැම්බර් 30 දින වන විටත් අවසන්කර නොතිබුණු අතර භෞතික කාර්යසාධනය සියයට 65 ක් හා මූල්‍ය කාර්යසාධනය සියයට 30 ක්ව පැවතුණි. මේ අනුව අදාල ආයතනය වෙත කොන්ත්‍රාත්තුව සඳහා රු. 6,684,069 ක මුදලක් පමණක් ගෙවා තිබුණි.

වසර 3 ½ කට අධික වූ ප්‍රමාදය හේතුවෙන් මුල් කොන්ත්‍රාත්තුව අවලංගු කර, කොන්ත්‍රාත්තුවේ ඉතිරි සියයට 35 ක් වූ වැඩ කොටස රු. 8,250,000 කට මූලික කොන්ත්‍රාත්තුවේ උප කොන්ත්‍රාත්කරු වෙත ප්‍රදානය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අදාල නව කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් කාර්යසාධන ඇප බැඳුම්කරයක් හා අත්තිකාරම් බැඳුම්කරයක් ලබාගැනීමකින් තොරව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 50.18 ක ප්‍රමාණයක් වූ රු. 4,140,000 ක මුදලක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි.

(ආ) කොන්ත්‍රාත් ගිවිසුමට අනුව කොන්ත්‍රාත්තුවේ වැඩ 2015 ජුනි 04 දින වන විට අවසන් කළ යුතුව තිබුණද, ගිවිසුම ප්‍රකාර කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කර නොතිබුණු අතර ප්‍රමාද කාලය සඳහා කොන්ත්‍රාත්කරුගෙන් දඩ මුදල් අයකර ගන්නා ආකාරය කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන්ව නොතිබුණි.

(ඇ) කොන්ත්‍රාත්තුවේ උපදේශකවරුන් ලෙස කටයුතු කරන මොරටුව විශ්වවිද්‍යාලයේ පීඨාධිපති විසින් කාලානුරූපව ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් කාර්යසාධන තොරතුරු පිළියෙල කර ඉදිරිපත් කළ යුතු වුවද, එසේ සිදු කර නොතිබුණි.

### 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

2014 දෙසැම්බර් 31 දිනට තනතුරු 29 කට අදාලව අනුමත සේවක සංඛ්‍යාව 1,838 ක් වූ අතර, තථ්‍ය සේවක සංඛ්‍යාව 1,465 ක් වූයෙන් සේවක සංඛ්‍යාවේ 413 ක ඌනතාවයක්ද, 40 ක අතිරික්තයක්ද පැවතුණි. මීට අමතරව අනියම් කම්කරුවන් වශයෙන් 43 දෙනෙක්ද බඳවාගෙන තිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති පීඊඩී/12 චක්‍රලේඛයේ 5:1:3 වගන්තිය ප්‍රකාරව අදාල මුදල් වර්ෂය ආරම්භවීමට දින 15 කට ප්‍රථම අදාල අමාත්‍යාංශය, භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ විගණකාධිපති වෙත සංයුක්ත සැලැස්ම ඉදිරිපත් කළයුතු වුවද, රෝහලේ 2014 සිට 2018 කාලසීමාවට අදාල සංයුක්ත සැලැස්ම විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද්දේ 2014 දෙසැම්බර් 10 වන දිනදීය. සංයුක්ත සැලැස්මට අනුගතව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය. එසේම සංයුක්ත සැලැස්මේ දක්වා තිබූ අභිමතාර්ථයන්ද ක්‍රියාවට නංවා නොතිබුණෙන් යෝජනාවන්ට පමණක්ම සීමා වී තිබුණු බැව්ද දක්නට ලැබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම අනුව 2014 වර්ෂයේදී වැඩ නිම කළ යුතු ලෙස දක්වා තිබූ කාර්යයන් 03 ක් හා 2014 වර්ෂයේදී ආරම්භ කර සියයට 50 ක් දක්වා වැඩ නිම කළ යුතු ලෙස දක්වා තිබූ කාර්යයන් 03 ක් විගණිත දිනය වූ 2015 මාර්තු 31 දින වන විටත්, ආරම්භ කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව මෝටර් රථ අංගනය වැඩි දියුණු කිරීමේ කටයුතු 2014 වර්ෂයේදී අවසන් විය යුතු වුවද, විගණිත දිනය වූ 2015 මාර්තු 31 දින වන විටත් වැඩ අවසන් වී නොතිබුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂයට අදාල අර්ධ වාර්ෂික අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.4 **ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගැනීමට සැලසුම්කර තිබුණු රු. 72,819,000 ක් වටිනා මූලධන වත්කම් මිලදී ගෙන නොතිබූ අතර ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර නොතිබුණු රු.56,537,366 ක් වටිනා ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගෙන තිබුණි. විගණන නියැදි පරීක්ෂාවේදී අසාමාන්‍ය ලෙස මුදල් වැඩිපුර වෙන්කරවා ගැනීම් හා ඇස්තමේන්තු කර තිබූ වටිනාකම් ඉක්මවා මිලදී ගැනීම් සිදු කර තිබුණු බැව් නිරීක්ෂණය විය.

5.5 **අයවැය ලේඛනමය පාලනය**

අයවැය ලේඛනය සහ තථ්‍ය ආදායම් වියදම් අතර ආදායම් විෂයයන් 02 කට සහ වියදම් විෂයයන් 17 කට අදාලව සියයට 55 සිට සියයට 2,858 දක්වා පරාසයක විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5.6 **පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කාරක සභාවේ නියෝග**

2012 සැප්තැම්බර් 21 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී රෝහලට අදාල නව ව්‍යාපාර සැලැස්ම පිලියෙල කර එය පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස නිර්දේශ කර තිබුණද, 2014 දෙසැම්බර් 31 දින වන විටත් එය ඉදිරිපත් කර නොතිබුණි.

6. **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මහාරෝග්‍යශාලා මණ්ඩලයේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) සේවක මණ්ඩල පරිපාලනය
(ඇ) තොග පාලනය
(ඈ) මූල්‍ය පාලනය
(ඉ) නිදහස් වෛද්‍ය ප්‍රතිකාර පිරිවැය
(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය